# තමුන් තාම වැඩ කරන්නෙ කඩවත ඩිපෝවෙද?






මේ කතාවත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන් සංවිදානය කළ මනෝ රාත්‍රිය දවසෙදි අපේ හිතවත් ජයලත් මනෝරත්නයන් කී කතා රැසින් එකක්.

බොහෝ වෙලාවට නලු නිළියන් වන හැමෝම හිතන් ඉන්නෙ මේ ලෝකෙ ඉන්න හැම දෙනාම ඔවුන්ව අඳුනනවා කියලයි. ඒ නිසා යන යන තැනදි හැමෝම ඉදිරිපත් වෙලා තමන් සමග කතා කරයි කියලත් අපි හිතනවා. අපි ඉතින් යටි හිතින් ඒක බලාපොරොත්තුත් වෙනවනෙ. සමහර වෙලාවට අනිත් නැති අයට නැති වාසිත් අපට මේ නිසා ලැබෙනවා. තැනකට වැඩක් කරගන්න ගියාම අපව අඳුනගන්න අය අපට ඉක්මණින් ඒ වැඩය කරදෙන අවස්ථා එමටයි. ඒ විතරක්ද? රථවාහන වරදකදි පොලීසියට කොටු වුණාම පවා ගැලවිලා යන්න අපට ඕනෙ තරම් ඉඩ ප්‍රස්තා ලැබිලා තිබෙනවා. හැමෝම පිනවන නලුවන් වන අපට කරදර කරන්න කවුද කැමති. ඒක ඉතින් නලු කමේ පිනක්.

ඕකෙ අනිත් පැත්තකුත් තියෙනවා. තවත් සමහරු අඳුරගෙන නොදැක්කා වගේ ඉන්නත් උත්සාහ කරනවා. ඒ අය හිතනවා අපි මොකටද මුං එක්ක කතා කරන්ඩ යන්නෙ කියලා. මේ මෙල්බන් වලදිත් එහෙම අද්දැකීමක් ලැබුණ නලුවෙක් ඉන්නවා. මිනිහා දවසක් ප්‍රෙස්ටන් මාකට් එකේ යද්දි ලංකාවෙ අම්මා කෙනෙක් දුවක් සමග යනවා හමුවුණා. අම්මා බොහොම ලෙංගතු විදිහට හිනාවෙලා කතා කරන්න සැරසුණා. මේක දැකපු දුවට කේන්ති ගියා. "මෙන්න මෙහ එන්න" කියලා දුව අම්මගෙ අතින් ඇදගෙන යන්න පටන් ගත්තා. අපේ නලුවා මේක හොඳින් බලං හිටියා. ඔහු අම්මා ළඟට ගියා.
අම්මට කතා කළා.
"කොහොමද අම්මේ"

"අනේ කොහොමද පුතේ. පුතා රඟපාපු ....... ටෙලි නාට්‍යය අපි හරිම ආසාවෙන බැලුවා. අනේ දැකගත්ත එකත් සතුටක්" අම්මා දුව දිහා බයෙන් බයෙන් බලමින් කිව්වා.

"අම්ම නම් මාව අඳුරගත්තා. ඒත් මෙහෙට එන සමහර අයට නම් මාසෙන් දෙකෙන් ඔක්කොම අමතක වෙනවා.. අම්මගෙ දුවට වගේ" අපේ නලුවා ඇඟට පතට නොදැනී කිව්වා.

එයිට වඩා වෙනස් කතාවක් තමයි මනෝට වුණේ.

දවසක් රෑ එකට විතර මනෝ අයියා නාට්‍යයක් ඉවර කරලා යාලුවෙන් එක්ක කාර් එකේ එනවා. අතර මගදි කාර් එටකේ රෝදෙක හුළං ගියා. වාසනාවට ළඟ පාත වින්කලයක් තිබුණා. මනෝ අයියත් යාලුවත් දොරට ගහලා වින්කලේ බාසුන්නැහේ ඇහැරවා ගත්තා.

"බාසුන්නැහේ.. අඳුනනව නේද මේ මහත්තයා.. මතකයිනෙ.. " යාලුවා බසුන්නැහේට කියනවා. "..හරි වැඩේනෙ වුණේ.. මහත්තයගෙ කාර් එකේ පැච් එකක් ගියානෙ.. බාසුන්නැහේට මහත්තයව මතකයි නේද.. හෙට උදේට බාසුන්නැහේට කිව්වැකි යාලුවන්ටත්.. මහත්තය ඇවිත් බාසුන්නැහෙග වින්කලෙන් පැච් එකක් දාගත්ත කියල"

යාලුවා කෙළවරක් නැතිව කියනවා. මනෝ අයියටත් ලැජ්ජයි. ඇඟ මැලි කඩ කඩ බාසුන්නැහේ මනෝ අයියගෙ මූණ දිහා බැලුවා. බලලා ආයෙත් ඔන්න පැච් එක දාන්න ටියුබ් එක මදිනවා. වැඩේ ඉක්මන් කරගන්න ආයෙ සැරයක් යාලුවා කතාව පටන් ගත්තා.

"බාසුන්නැහේ.. බාසුන්නැහේට දැන් ගෙදර අයට කියතැහැකි නේද. දන්නවනෙ මේ මහත්තයට.. බාසුන්නැහේටත් ඉතින් ලොකු දෙයක් මේ රෑ මේ මහත්තයා ආව එක. නැද්ද ඉතින්.. "

බාසුන්නැහේ ආයෙත් වතාවක් මනෝ අයියගෙ මූන දිහා බැලුවා. වෙලාව කියන්නෙ අපේ යාලුවටත් සිංහලෙන් කියනවා නම් කොමන් සෙන්ස් ඇත්තෙම නෑ.

"අඳුරගන්න බැරි වුනා නේද? බලන්නකො පොඩ්ඩක්.. බාසුන්නැහේට මතක් වෙයි.." යාලුවා ආයෙම කියනවා.

බාසුන්නැහේ ආයෙ ඔලුව හරවලා මනෝ අයියා දිහා ටිකක් වෙලා බලා හිටියා. ඔන්න බාසුන්නැහේ අඳුර ගත්තා.

"ංආ.. ඔහේද..? තාම වැඩ කරන්නෙ කඩවත ඩිපෝවෙද..?" බාසුන්නැහේ ඇහුවා.

යාලුව මූණ ඇඹුල් කරගෙන මනෝ අයියා දිහා බැලුවා.

"මේ ටයර් ටියුබ් එක්ක දවස පුරා හැප්පෙන මිනිස්සු කොහොමද බං කලාකාරයො අඳුරන්නෙ?" ආපහු එන අතරේ මනෝ අයියා යාලුවට කිව්වා.

## හැඳි මිටේ නුවණ?

අපේ ප්‍රවීණ කලා ශිල්පි ජැක්සන් ඇන්තනි මුහුණ දුන් සිදුවීමක් මේ

මරාසාද් පුහුණුවෙන් පස්සෙ මහ රෑක ජැක්සන් කුමාරිත් සමගින් ගෙදර යන්න එනවා. පයින්ම රේල් පාර දිගේ කට්ට කලුවරේ යද්දි පාලුව මකන්න කුමාරි මරාසාද් නාට්‍යයේ ගීතයක් මුමුණන්න පටන් ගත්තා. ඒ මිමිනීමට ජැක්සනුත් හිතෙන් මරාගෙ චරිතයට ආරූඪ වෙලා හිටියෙ.

අසන් මරාවෙනි අසන්
අප දුගියන් පත් දුකටා

මරා ඔහුගේ නානව ඔරුවේ බැස සිටියදී චාරට් කෝර්දේ මරා ගේ කෙස් වැටියෙන් අල්ලා කිනිස්සකින් අනින ලද අවසාන තත්පර කීපය ජැක්සන්ගෙ හිතේ මැවුණා. එපමණයි. එසැණකින් ම හොරු තුන්දෙනෙක් ඉස්සරහට පැන්නා. එකෙක් ජැක්සන්ගෙ බෙල්ලට පිහියක් තියලා ඔහුගෙ අතේ තිබ්බ මගුල් මුද්ද චේන් පොට සහ සාක්කුවේ තිබුණ රුපියල් දහතුනයි පනහ සොරා ගත්තා. ඒ අකරේ අනික් හොරු දෙන්නා කුමාරි සමගින් පොර බදනවා. ඈ කෑ ගසනවා. ඒත් මේ පාලු රේල් පාරෙ මේ මහ රෑ කාට ඇහෙන්නද.

"තොගෙ ගෑණිගෙ කට වහගන්න කියපන්. නැත්නම් තොගෙ බෙල්ල කපනවා." ජැක්සන්ගෙ බෙල්ලට පිහිය තියාගෙන ඉන්න මැරයා කියනවා. පිහිය ටිකෙන් ටික බෙල්ලට තද වෙනවා ජැක්සන්ට දැනෙනවා. ප්‍රාණ බය නිසා ඇඟත් වෙවුලනවා

"කුමාරි කෑ ගහන්ඩ එපා" ජැක්සන් හිමිහිට කියනවා. මේ ගාලගෝට්ටිය අස්සෙ ඒක කුමාරිට ඇහෙන්නෙ නෑ. "දැන් මං ඉවරයි" ජැක්සන් හිතුවා.

මෙන්න වාසනාවට ඈතින් කෝච්චියක් එනවා. කෝච්චියේ එලියට හොරු කලබල වුණා. තුන් දෙනාම දුවන්න පටන් ගත්තා. මරණයේ දොරකඩටම ගිහින් ආපහු ආව ජැක්සන් ගෙ හිතට මහා ශක්තියක් ආවා. යටි කිරියෙන් කෑ ගසමින් ජැක්සන් හොරු තුන් දෙනා පස්සෙන් පන්නන් පටන් ගත්තා. හොරුන්ගෙන් දෙන්නෙක් වෙලට පැනලා ගැලවුණා. තුන් වෙනි හොරා අල්ලගත්ත ජැක්සන් ඌ මදියි නොකියන්න බෙදුවා. පොලිසියෙන් පැමිණ සොරා අල්ලා ගන්නා තුරුම ජැක්සන් ඌට පහර දුන්නා. මිට මොළවාගෙන හිටිය හොරාගෙ අතේ තිබුණ ජැක්සන්ගෙ මගුල් මුද්ද පොලිසියෙන්ම ජැක්සන්ට ආපහු දුන්නා.

මේ සියල් වෙනතෙක් හඬමින් හිටිය කුමාරි පොලිස් නිලධාරියෙකුගෙන් විදුලි පන්දමක් ඉල්ලාගෙන නැවත රේල් පාර දිගේ ගියා. රේල්ල පීල්ලක් යට සඟවා තිබුණ ඈගේ මුද්ද අහුලා ගත්තා.

"හොරා එක්ක ගහ ගන්න අතරේ මං හෙමින්ම මුද්ද රේල් පාර යට හැංගුවා" කුමාරි අඬමින්ම කියනවා.

වියරු හොරෙක් එක්ක පොර බදින ගමන් ඌටත් නොදැනී මුද්ද ගලවා රේල් පීල්ලක් යටින් සඟවන්නටත් ඒ සැඟවූ තැන හඳුනාගන්නට සළකුණක්ද තබා ඒමට තරම් කුමාරිගේ හැඳිමිටේ නුවණ දික් වී තිබීම ගැන අදත් ජැක්සන් බොහොම ආඩම්බරෙන් කතා කරනවා.

රෑ තුන් යාමයේ නිදි වරාගෙන රසිකයන් පිනවන රංග ශිලපීන් මුහුණ දෙන මේ වගේ දුෂ්කර අවස්ථා කොයි තරම්ද?

